7

# හත්පෙති මල



පුංචි ගැනු ළමයෙක් හිටියා. එයාගෙ නම ශේන්යා. දවසක් අම්මා ඇයව පාන් වළලු ගේන්න කඩේට යැව්වා. ශේන්යා ගත්තා පාන් වළලු හතක්. සුවඳ පාන් වළලු දෙකක් තාත්තාට, පොපි ඇට දාපු දෙකක් අම්මාට, සීනි දාපු දෙකක් තමාට, රෝස පාට පුංචි එකක් පාව්ලික් මල්ලිට. ඉතින් ශේන්යා පාන් වළලු එල්ලා ගෙන ගෙදර යනවා. ඈ යන්නේ වටපිට බලමින් පාර දෙපැත්තේ තිබෙන දන්වීම් කියවමින්. මේ අතරතුරේ එක් නාඳුනන බල්ලෙක් ඇය පස්සෙන් එන්න පටන් ගත්තා. ඌ ඔක්කොම පාන් වළලු එකින් එක කෑවා.

ශේන්යාගේ අතට හැල්ලුවක් දනුණා. ආපසු හැරිලා බැලින්නම් පමා-වෙලා වැඩියි. බල්ලා අන්තිම රෝස පාට පාන් වළල්ලත් අරගෙන කනවා.

“අයියෝ! ..... මෙහෙම නපුරු බල්ලෙක්!” ශේන්යා කෑගහලා ඌව අල්ලන්න දිව්වා. ඈ දිවුවා..... දිවුවා.... බල්ලා අල්ලා ගන්න බැරිවුණා. ඈ අතරමං වුණා. ශේන්යා බය වෙලා අඬන්න ලැහැස්ති

වුණා. එක පාරට ම කොහෙන් දෝ ආච්චි කෙනෙක් ආවා.

"ළමයො, ළමයො, මොකද උඹ අඬන්නේ?"

ශේන්යා ආච්චිට ඔක්කොම කීවා. ආච්චිට ශේන්යා ගැන දුක හිතුණා. ආච්චි ශේන්යා තමන්ගෙ මල්වත්තට එක්කර ගෙන ගිහිල්ලා මෙහෙම කීවා.

"කමක් නෑ, අඬන්න එපා. මම උඹට පිහිට වෙන්නම්. මගේ මල්වත්තේ මලක් පිපිලා තියෙනවා. ඒ මලට කියන්නෙ "**හත්පෙති මල**" කියල. ඒ මලට ඔක්කොම කරන්න පුළුවන්. උඹ පාරේ යන කොට වටපිට බැලුවා වුණත් හොඳ ළමයෙක් බව මම දන්නවා. මම උඹට ඒ හත්පෙති මල තෑගි කරන්නම්. ඒක ඔක්කොම කර දෙනවා."



ඉතින් මෙහෙම කියලා ආච්චි මල්පාත්තියකින් ලස්සන මලක් කඩලා ශේන්යාට දුන්නා. ඒ මලේ කහ, රතු, තද නිල්, කොළ, තැඹිලි, දම්, ළා නිල් පෙති හතක් තිබුණා.

"මේ මල සාමාන්‍ය එකක් නොවෙයි," ආච්චි කීවා. "උඹට ඕනැ දෙයක් කර දෙනවා. එක මල්පෙත්තක් කඩලා වීසි කරලා මෙහෙම කියන එක විතරයි.

**මල්පෙත්තේ - මල්පෙත්තේ**

**උතුරු දෙසට - දකුණු දෙසට**

**බටහිරටත් නැගෙනහිරට**

**ඉගිළ ඉගිළ මෙහැම දෙසට**

**කැරකීලා ඇවිත් බිමට**

**මා කියන දෙය කර දෙන් මට**

ඉතින් මෙහෙම කියලා මේ මේ දේ මට කර දෙන්න කියන්න. එතකොට හරියට ම කර දෙනවා.''

ශේන්යා බොහොම විනීත විදියට ස්තුති කරලා ගේට්ටුවෙන් එළියට ගියාට පසුවයි මතක් වුණේ, ගෙදරට යන්න පාර දන්නේ නැති බව. මල්වත්තවත් ආච්චිවත් පේන්න නෑ. ශේන්යා හනික කහ පාට මල්පෙත්ත කඩලා එය වීසි කරලා ආච්චි කී කවිය ගායනා කර කීවා.

**''පාන් වළලුත් එක්ක මා ගෙදර ඉන්න ඕනෑ.....''**

ඇයට මෙය කියලා ඉවර කරන්න ලැබුණේ නැහැ. ඒ මොහොතේ ම පාන් වළලුත් එක්ක ඈ ගෙදර. ශේන්යා පාන් වළලු අම්මාට දීලා මෙහෙම හිතනවා.

''මේක හරි පුදුම මලක්.... හොඳ ම ලස්සන මල්පෝච්චියේ මේ මල තියන්න ඕනෑ.'' ඈ රාක්කයේ උඩ ම තට්ටුවේ තිබෙන මල්පෝච්චිය ගන්න පුටුවක් උඩට නැඟුණා. ජනේලය ළඟින් කාක්කො රංචුවක් ඉගිළිලා යනවා. කාක්කො අට දෙනෙක් ද නැත්නම් හත් දෙනෙක් ද කියා හරියට ම දන ගන්න ශේන්යාට ඕනෑ කළා. ඈ ඇඟිල්ල දික් කරලා ගනින්න පටන් ගත්තා. දඩාස්! මල්පෝච්චිය බිමට වැටුණා.

''උඹ ආයෙමත් මොකක් ද බින්ද නේ ද?'' අම්මා කුස්සියේ ඉඳලා කෑගැහුවා.

''නෑ නෑ අම්මා, මම මොකුත් බින්දෙ නෑ''



ශේන්යා හනික රතු මල්පෙත්ත කඩලා 'මල් පෙත්තේ – මල්පෙත්තේ' කවිය ගායනා කර "**අම්මාගෙ මල්පෝච්චිය තිබුණු විධියට ම හැදෙන්න ඕනෑ.**" කීවා. එතකොට ම කැඩුණු බිඳුණු කැලි ඔක්කොම එකට එකතු වෙලා මල්පෝච්චිය තිබුණු විධියට ම හැදුණා.


ශේන්යා මිදුලට ආවා. මිදුලෙ පිරිමි ළමයි කට්ටියක් සෙල්ලම් කරනවා.

"අනේ! මාවත් ගන්න ඔයගොල්ලන්ගෙ සෙල්ලමට."

"අපි උතුරු කෙළවරේ සෙල්ලම කරනවා. අපි ඒ සෙල්ලමට ගැහැනු ළමයි ගන්නෙ නෑ."

"මට ඕනැ නෑ..... ඔයගොල්ලො නැතුව මම යනවා උතුරු කෙළවරට."

ශේන්යා ගේට්ටුවට මුවා වෙලා හත්පෙති මල අරගෙන තද නිල් පාට පෙත්ත කඩලා "මල්පෙත්තේ – මල්පෙත්තේ" කවිය ගායනා කළා. "**දැන් මා උතුරු කෙළවරට ගෙනියන්න ඕනෑ.**" එක පාරට ම හුළඟ හැමුවා. ඉර නොපෙනී ගියා. භයානක විධියට අඳුරු වුණා. ඇගේ පා යට පොළොව බමරයක් වගේ



කරකැවුණා. උතුරු කෙළවරේ ඇයට ලොකු තනිකමක් දැනුණා.

"අයියෝ! අම්මා, සීතලයි" ශේන්යා කෑගහන්නයි, අඬන්නයි පටන් ගත්තා. කඳුළු මිදිලා අයිස් වෙලා නහයෙන් එල්ලුණා.

අයිස් කඳුවලින් සුදු වලස්සු හත් දෙනෙක් ශේන්යා ළඟට එනවා.

ඔක්කොම එක වගේ භයානකයි. ශේන්යා හොඳට ම බය වෙලා හත්පෙති මලේ කොළ පාට පෙත්ත කඩලා වීසි කරලා පුළුවන් තරම් හයියෙන් 'මල්පෙත්තේ – මල්පෙත්තේ' කවිය ගායනා කළා.

"**ආයෙමත් මා අපේ මිදුලට ගෙනියන්න ඕනෑ.**" කියන කොට ම ඇ මිදුලෙ. පිරිමි ළමයි ඇය දිහා බලලා හිනා වෙනවා.

ශේන්යාට තරහ ගියා. ඇ පිරිමි ළමයි එක්ක සෙල්ලම් නොකරන්නට තීරණය කරලා වෙන මිදුලකට ගියා, ගැහැනු ළමයි එක්ක සෙල්ලම් කරන්න.

ගිහින් බැලින්නම්, ගැහැනු ළමයි ළඟ තියෙනවා නොයෙක් ජාති සෙල්ලම් බඩු..... එක්කෙනෙක් ළඟ පුංචි කරත්තයක්. තව කෙනෙක් ළඟ රෝද තුනේ බයිසිකලයක්. තවත් කෙනෙක් ළඟ තොප්පියකුයි, සපත්තුයි අන්දපු කතා කරන ලොකු බෝනික්කෙක්. ශේන්යාට කනගාටු හිතුණා. "හොඳයි! ඔය ගොල්ලන්ට මං පෙන්වන්නම් කාටද සෙල්ලම් බඩු තියෙන්නෙ කියලා." හත්පෙති මලේ තැඹිලි පාට මල්පෙත්ත කඩලා ඇ කවිය කීවා.

**"මේ ලෝකයේ තිබෙන ඔක්කොම සෙල්ලම් බඩු මට ලැබෙන්න ඕනෑ"**

ඒ මොහොතේ ම හැම පැත්තෙන් ම ශේන්යා ළඟට සෙල්ලම් බඩු ගලා එන්න පටන් ගත්තා. හැම පාරකින් ම බෝනික්කො, බෝල, බයිසිකල්, සෙල්ලම් කාර්, ට්‍රැක්ටර් පෙරළීගෙන පෙරළීගෙන එනවා. සෙල්ලම් **අහස්යානා,** බැලුම් කෝටි ගණන් අහසේ පියාඹනවා. පැරෂුට්වලින් බෝනික්කෝ බහිනවා. රුසියානු සෙල්ලම් බඩුවලින් පස්සේ අමෙරිකානු සෙල්ලම් බඩු එන්න පටන් ගත්තා. දැන් මුළු නගරය ම සෙල්ලම් බඩුවලින් පිරිලා. ශේන්යා පඩි

පෙළේ – සෙල්ලම් බඩු ඈ පස්සෙන්. ශේන්යා සඳලුතලයේ – සෙල්ලම් බඩු ඈ පස්සෙන්. බැරි ම තැන ඈ වහලට නැඟලා හනික දම් පාට පෙත්ත කඩලා වීසි කරලා 'මල්පෙත්තේ – මල් පෙත්තේ' කවිය ගායනා කළා.

**"සෙල්ලම් බඩු හනික ආපසු සාප්පුවලට යන්න ඕනෑ."**

එතකොට ම සෙල්ලම් බඩු ඔක්කොම අතුරුදහන් වුණා. ශේන්යා මල බැලුවා ම තව තියෙන්නෙ එක ම එක මල් පෙත්තයි.

"වෙච්ච දේ! පෙති හයක් ම නාස්ති වුණා කිසි ම පලක් නැතිව.... කමක් නෑ, ඉස්සරහට කල්පනාකාරී වෙනවා....."

ඉතින් ශේන්යා වීදියට බැහැලා කල්පනා කර කර යනවා.



ශේන්යා දැක්කා ගේට්ටුව ළඟ හොඳ ලස්සන පිරිමි ළමයෙක් වාඩිවෙලා ඉන්නවා. ඔහුට තිබුණා නිල් පාට ප්‍රීතිමත් ශාන්ත විශාල ඇස්. ශේන්යාට හිතුණා ඔහු දන හඳුනා ගන්න. ඇය කිසිම බයක් සැකක් නැතිව ඔහු ළඟට ම ගියා.

"ඔයාගෙ නම මොකක් ද?"

"වීත්යා, ඔයාගෙ නම?"

"මගේ නම ශේන්යා. වීත්යා, එනව ද මා එක්ක සෙල්ලම් කරන්න?"

"මට බෑ, මම කොර වෙලා."

ශේන්යා දැක්කා, ඔහුගේ පයේ දා තිබෙන ලොකු සපත්තුව.

"මට හරි දුකයි!" ශේන්යා කීවා."මම ඔයාට හරි කැමැතියි. මට ඔයා එක්ක බොහොම කැමැත්තෙන් සෙල්ලම් කරන්න තිබුණා නේ!........"


"මමත් ඔයාට හුඟාක් කැමතියි. මමත් ඔයා එක්ක සෙල්ලම් කරන්න බොහොම කැමැතියි. නමුත් **කනගාටුයි.** ඒක කරන්න බෑ. මට කරන්න කිසි ම දෙයක් නෑ. මගේ මුළු ජීවිතේ ම මෙහෙමයි."

"හානේ! වීත්යා, ඔයා මොනව ද මේ කියන්නෙ?"

ශේන්යා තම සාක්කුවෙන් පුදුම හත්පෙති මල අරගත්තා.

බොහොම පරිස්සමින් මලේ අවසාන ළා නිල් පාට පෙත්ත කඩලා මල්පෙත්ත තමාගේ ඇස් ඉදිරියෙන් තියල, ඇඟිලිවලින් වීසි කරල, හීන් හඬින්, ප්‍රීතියෙන් මෙහෙම ගයන්න පටන් ගත්තා.

මල්පෙත්තේ – මල්පෙත්තේ
උතුරු දෙසට – දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කරදෙන් මට
"**වීත්යා සනීප කරන්න ඕනෑ!**"



එතකොට ම වීත්යා බංකුවෙන් නැගිටලා ශේන්යා සමග සෙල්ලම් කරන්න පටන් ගත්තා.

ඔහු කොපමණ හොඳට දිවුවා ද කිවුවොත් ශේන්යාට ඔහු අල්ලා ගන්නත් බැරුව ගියා.



***වැලැන්තීන් කතායෙව්*** *ගේ* ***'හත්පෙති මල'*** *පොත ඇසුරෙනි.*

*අනුවාදය*

***දැදිගම වී. රුද්‍රිගු***

## පැහැදිලි කිරීම්

**පාන් වළලු** – රුසියාවේ ජනප්‍රිය පැණි රස කෑම වර්ගයකි.

**පොපි ඇට** – කජුවලට සමාන ඇට වර්ගයකි.

**උතුරු කෙළවර** – රුසියාවේ උතුරු ප්‍රදේශය

**උතුරු කෙළවරේ සෙල්ලම** – දෙපා ලෑලි කැබලි මත තබා ලිස්සා යන හිම ක්‍රීඩාවකි.

අවබෝධය

1. ශේන්යා පාන් වළලු මිල දී ගත්තේ කවුරුන් සඳහා ද?
2. ශේන්යාට පාන් වළලු අහිමි වූයේ කෙසේ දැයි විස්තර කරන්න.
3. ආච්චි ශේන්යාට දුන් පුදුම මලෙන් සිතූ පැතූ දේ ලබා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
4. හත්පෙති මලේ **කහ, රතු, තද නිල්, කොළ, තැඹිලි, දම්** යන පාටවලින් යුතු මල්පෙති ශේන්යා පාවිච්චි කළ අවස්ථා අනුපිළිවෙළින් ලියන්න.
5. වීත්යාගේ පාදයේ ආබාධය සුව වූ ආකාරය විස්තර කරන්න.
6. ශේන්යා මල්පෙති කඩන විට කී කවිය ගායනා කරන්න.

භාෂා ක්‍රියාකාරකම්

7. මේ කතාව ඔබේ වචනයෙන් කියන්න.
8. මේවා ලියන බසට හරවන්න.
   i. බල්ලෙක් ඇය පස්සෙන් ආවා.
   ii. ශේන්යා හොඳට ම බය වුණා.
   iii. ආච්චි ශේන්යාට මලක් තෑගි කළා.
   iv. මිදුලේ හිටිය පිරිමි ළමයි ශේන්යා දිහා බලා හිනා වුණා.
   v. කකුල සුව වූ වීත්යා සෙල්ලම් කළා.
9. ශේන්යා ගැන වාක්‍ය කීපයක් ලියන්න.
10. පහත දක්වෙන අදහස් අලංකාර කර නැවත ලියන්න.

උදා:- මලක් පිපුණේ ය.

අපේ වත්ත පහළ මල් ගසක ලස්සන කහ පාට මලක් පිපුණේ ය.

i. ශේන්යා ආච්චිට ස්තුති කළා ය.

ii. සෙල්ලම් බඩු ගලා ආවේ ය.

iii. වීත්යා දිව්වේ ය.

iv. සුළඟ හමයි.

v. ඉර නොපෙනී යයි.

11. ආබාධයකින් පෙළෙන අයෙකුට උදවු කළ අවස්ථාවක් ගැන කියවෙන කුඩා කතා පුවතක් ලියන්න.

## පැවරුම්

1. i. වීත්යාට ඇවිදින්නට පුළුවන් වී තිබෙන බව දකින වීත්යාගේ මව ඉතා සතුටට පත් වන්නට ඇත. ඇය ශේන්යාට කෙසේ ස්තුති කරන්නට ඇද්දැයි සිතා එය කියන්න.

   ii. කෙනකුට ස්තුති කරන විට ඉංග්‍රීසියෙන් පාවිච්චි කරන යෙදුම කියන්න. එය ලියන්න.

2. හත්පෙති මල කතාවේ ඔබේ සිත් ගත් සිදුවීමක් චිත්‍රයට නගන්න.

3. **කේයස්** නමැති කවියාගේ '**සුදෝ සුදු**' කාව්‍යයෙහි අන්ධ දරුවා සහ මව අතර ඇති වන සංවාදයේ සඳහන් වන කවි කීපයක් සොයා ලියන්න.